www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2008 වසරේ බිඳ වැටීම හා එහි විප්ලවවාදී ඇඟවුම්

## දෙවන කොටස

**The crash of 2008 and its revolutioíry implications -- Part 2**

**නික් බීම්ස් විසිනි**
**2009 පෙබරවාරි 05**

මා පෙන්වා දෙමින් සිටියේ ගෝලීය මූල්‍ය අර්බුදයේ සැබෑ වැදගත්කම ග්‍රහනය කර ගත හැක්කේ එය එහි ඓතිහාසික සන්දර්භය තුල තැබීමෙන් පමනක් බවය. වෙනත් වචනවලින් කිව හොත් අප ආර්ථික හා ඓතිහාසික ක්‍රියාවලීන්ගේ තර්කනය ඒවා නැඟී ආ තත්වය තුල විමසා බැලිය යුතුය.

එසේ නම් මෙම කාර්යයට අප අතගසන්නේ කෙසේ ද? ඒ සඳහා කාල් මාක්ස් විසින් වර්ධනය කල ඓතිහාසික විශ්ලේෂන විධික්‍රමය යොදා ගැනීම අවශ්‍ය කෙරේ. ඔබගෙන් සමහරෙක් කිහිප වාරයක් ඒවා ගැන අසා හෝ කියවා ඇතුවා නිසැක ය. එහෙත් මාක්ස් ඓතිහාසික භෞතිකවාදී විශ්ලේෂනයේ සැකිල්ල ගෙනහැර දැක්වූ *දේශපාලන අර්ථශාස්ත්‍රය පිලිබඳ විවේචනයට පෙර වදනක්* කෘතියෙන් ඡේද කිහිපයක් පුනරුච්ඡාරනය කිරීමට තරම් වටනේය.

"ස්වකීය පැවැත්මට අදාල සමාජ නිෂ්පාදනයේ දී මිනිසුන් සිය කැමැත්තෙන් ස්වාධීනව එනම්, නිෂ්පාදන බලවේගයන්ගේ ද්‍රව්‍යමය වර්ධනය තුල, දී ඇති අදියරක දී නිෂ්පාදනයට ඔබින නිශ්චිත සම්බන්ධතාවන්ට එලඹීම නොවැලැක්විය හැක්කේය. සමාජයේ සැබෑ පදනම වන ආර්ථික ව්‍යුහය මත නැඟී එන, සමාජ විඥානයේ නිශ්චිත රූපාකාරයන්ට අනුරූපී වන, නීතිමය හා දේශපාලන උපරි ව්‍යුහය මෙම නිෂ්පාදන සම්බන්ධතා සමස්තය තුල අන්තර්ගත වෙයි.... සංවර්ධනයේ නිශ්චිත අදියරක දී සමාජයේ ද්‍රව්‍යමය නිෂ්පාදන බලවේග, පවත්නා නිෂ්පාදන සම්බන්ධතා සමඟ හෝ - නීතිමය යෙදුම් තුල මෙය ඒ ආකාරයට ම ප්‍රකාශයට පත් නොවන තරම් ය - මෙතෙක් ඒවා ක්‍රියාත්මකව පැවති රාමුව තුල පවත්නා දේපල සබඳතා සමඟ ගැටුමකට එලඹෙයි. මෙම සම්බන්ධකම්, නිෂ්පාදන බලවේග වර්ධනයේ රූපාකාරයන්ගේ සිට ඒවායේ විලංගු බවට පත්වෙයි. එවිට ආරම්භ වන්නේ සමාජ විප්ලවයේ අවධියකි."

ධනේශ්වර නිෂ්පාදන මාදිලිය තුල නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය හා නිෂ්පාදනයේ සමාජ සම්බන්ධතාවන් අතර ප්‍රතිවිරෝධය වර්ධනය වන්නේ, අන්තර් සම්බන්ධිත ආකෘතීන් දෙකක් තුල ය.

නිෂ්පාදන බලවේගයන්හි ගෝලීය වර්ධනය හා - දේශසීමා, තාප්ප, එකම සම්මත කාලයක් භාවිතාකරන කලාප, රටවල් හා මහාද්වීප මත්තෙන් පැනයාමෙහි ලා ප්‍රාග්ධනයේ නෛසර්ගික ප්‍රවනතාවය - ධනේශ්වර පාලක පන්තීන්ගේ දේශපාලන බලය හා දේපල ආකෘතීන් ඓතිහාසිකව මුල්බැස තිබෙන ජාතික රාජ්‍ය පද්ධතිය අතර ගැටුමක් පවතියි. එනම්, ධනවාදය යටතේ වර්ධනය වූ නිෂ්පාදන බලවේගයන්හි ගෝලීය ස්වභාවය හා එකිනෙකට පස මිතුරු ජාතික රාජ්‍යයන්ට ලෝකය බෙදීයාම අතර ප්‍රතිවිරෝධයයි.

ශිෂ්ඨාචාරයේ ප්‍රගමනයෙහි එකම පදනම වන ශ්‍රමයේ නිෂ්පාදන ඵලදායිතාවයේ වැඩිවීම තුල ප්‍රකාශයට පත්වන පරිදි, නිෂ්පාදන බලවේගයන්හි වර්ධනය හා වැටුප් ශ්‍රමය මත පදනම්වූ නිෂ්පාදනයේ සමාජ සම්බන්ධකම් අතර ගැටුමක් ද පවතියි. මෙම ප්‍රතිවිරෝධය සියල්ලටත් ඉහලින් ගත් ඓතිහාසික දෘෂ්ටි ආස්ථානයකින්, දේශපාලන අර්ථශ්‍රස්ත්‍රයේ ඉතාමත් වැදගත් නියාමය ලෙස මාක්ස් විසින් අංගලක්ෂනය කල නීතියක් වන ලාභ රේට්ටුව පහල වැටීමේ ප්‍රවනතාවය පිලිබඳ නියාමය තුලම ප්‍රකාශිත වෙයි.

අපගේ කර්තව්‍යය වන්නේ මෙම ප්‍රතිවිරෝධයන්ගේ ඓතිහාසික වර්ධනය හඳුනා ගැනීමයි. ට්‍රොට්ස්කි විසින් 1921 ජූනි මාසයේදී කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ තුන්වන සමුලුවට ඉදිරිපත් කල ඔහුගේ සුප්‍රකට වාර්තාව හා *ධනේශ්වර වර්ධනයේ වක්‍රය* නමැති ලිපිය තුල සාරාංශ ගත කල හා, 1920 ගනන් මුල් භාගය තුල ඔහුගේ අනෙකුත් ලියවිලි හා දේශනයන්හි දී වර්ධනය කල, විශ්ලේෂනයේ විධික්‍රමය පිලිබඳ අදාලත්වය පවතින්නේ මෙහි ය.

ඓතිහාසික භෞතිකවාදී විධික්‍රමය වර්ධනය කිරීමේ දී ට්‍රොට්ස්කි කල ශ්‍රේෂ්ඨ ප්‍රතිපදානය වූයේ, ධනේශ්වර වර්ධනයේ සුවිශේෂී අංග දෙක වෙන් කොට හඳුනාගැනීමයි. ඉන් පලමු වැන්න ආර්ථික කටයුතුවල ඉහල පහල යාම් පෙන්නුම් කරන ව්‍යාපාරික චක්‍රයේ ක්‍රියාකාරිත්වයයි. උපතෙහි සිට මරනය දක්වා ම එය ධනවාදයට බැඳී පවතියි. දෙවැන්න, වසර ගනනාවක් නැත්නම් දශක ගනනාවක් පවා දිගට ඇදෙන ධනවාදී පද්ධතියේ වර්ධනය තුල සුවිශේෂී අදියරයන් සලකුනු කරන ඉතිහාසයේ දිගුකාලීන අවධීන් ය.

1920 ගනන් වල මැදභාගයේ සිට ආපසු හැරී බලන යමෙකුට එවන් සුවිශේෂී අදියරයන් දැකගත හැකිවේ. 1848 විප්ලවකාරී මහජන නැඟිටීම් දක්වා වැඩී ගිය 1847/48 ආර්ථික අර්බුදයකින් කුලුගැන්වුනු සාපේක්ෂව මන්දගාමී වර්ධනයක් මඟින් සලකුනු කල අවධියක් 1848 දක්වා පැවතුනි.

මෙම විප්ලවකාරී අරගලයන්ගේ ප්‍රතිපල වශයෙන් අලුතෙන් නැඟී එමින් සිටි කම්කරු පන්තිය පරාජයට පත්වූ නමුත්, ඒ අතර ම, බටහිර යුරෝපයේ ධනේශ්වර සංවර්ධනයට බාධකයන් බවට පත්ව තිබූ වැඩවසම්වාදයේ සුන් බුන් ද පසෙකට අතුගා දැමුනි. ඉන් පසුව පැමිනියේ ධනේශ්වර ප්‍රසාරනයේ බලගතු අවධියකි. දුම්රිය මාර්ග ඉදිකරනු ලැබුනි. ධනේශ්වර වෙලඳපොලට පුලුල්වීම සඳහා නොමිනිය හැකි ඉඩ ප්‍රස්ථා විවෘත විය. බ්‍රිතාන්‍යය ලෝකයේ වැඩපොල බවට පත් විය. නාවික ගමනාගමනය වේගවත් වර්ධනයක් අත්විඳි අතර ලෝක වෙලඳපොල පුලුල් විය. ධනේශ්වර සංවර්ධන චක්‍රයේ මෙම ඉහල නැඟීම 25 වසරක් පුරා පැවතුනි.

1873 මූල්‍ය අර්බුදයෙන් පසු භාගයේ නව යුගයක් ආරම්භ විය. අවසාන වශයෙන් අර්බුදය පහව ගිය ද එය මධ්‍ය වික්ටෝරියානු කොන්දේසි කරා යලි පැමිනියේ නැත. ඊලඟ දශක දෙක ආර්ථික ඉතිහාසයට එක් වූයේ 19 වන සියවසේ මහා අවපාතය ලෙසය. ඒවා අංගලක්ෂිත වූයේ සියල්ලටත් වඩා මිල ගනන් හා ලාභ රේට්ටු පහත වැටීම මඟිනි. මෙය එකතැන පල්වීමේ යුගයක් නොවීය. ඊට සපුරා පටහැනි ලෙස, ධනේශ්වර නිෂ්පාදන පරිමාව හා ධාරිතාව තුල විශේෂයෙන්ම එක්සත් ජනපදයෙහි සිදුවූ, ප්‍රමුඛ වෙනස්කම් හා එහි දැන් වර්ධනය වෙමින් පැවති කලමනාකරනයේ නව රූපාකාරයන් මෙන්ම ජර්මනියේ කාර්මික සංවර්ධනය ද පිටුපස පැවති ගාමක බලය වූයේ, ලාභ රේට්ටු මත ඇතිකල පහතට යොමුවූ පීඩනයයි.

ලෝක ආර්ථිකය තුල සුවිශාල වෙනස්කම් ද සිදුවෙමින් පැවතුනි. ඛනිජ හා අනෙකුත් අමුද්‍රව්‍ය මූලාශ්‍රයන් ද වෙලඳපොලවල් ද සුරක්ෂිත කරගැනීමෙහි ලා යුරෝපීය බලවතුන් දැක්වූ උත්සුකය හමුවේ, 19 වන සියවසේ අවසාන කාර්තුව දැකගත හැකි වූයේ යටත් විජිත සඳහා සිදුවූ දැවැන්ත පොරයක් ලෙසින් ය. ජාත්‍යන්තර නය පද්ධතියක් හා අනෙකුත් මූල්‍ය ආකෘතීන් පැනනැඟීමත් සමග බැංකු ක්‍රමයේ ප්‍රමුඛ වර්ධනයන් ද ඇතිවෙමින් තිබුනි. මෙම අවධිය සමහර විට විස්තර කරනු ලැබුවේ ගෝලීයකරනයේ පලමු රැල්ල ලෙසිනි.

1890 ගනන් මැද භාගය වන තෙක් පැවති මහා අවපාතයෙන් පසුව ධනේශ්වර චක්‍රයේ ඉහල නැඟීමක් ආරම්භ විය. ලාභ ඉහලයාමට පටන් ගෙන වෙලඳපොලවල් ප්‍රසාරනය වෙද්දී, ධනේශ්වරය විශ්වාසයේ හැඟීමකින් යුක්තව නව සියවසට ප්‍රවිෂ්ට විය. නව කොන්දේසි ප්‍රකට ලෙස ම එහි ප්‍රකාශනය අත්කර ගත්තේ දෙවෙනි ජාත්‍යන්තරයේ නායකත්වය තුල එඩුවාඩ් බර්න්ස්ටයින්ගේ සංශෝධනවාදී න්‍යායික ආකෘතිය තුලය. දැන් ඔහු ධනවාදයේ බිඳවැටීම පිලිබඳ මාක්ස්ගේ න්‍යාය සිදුවීම් මඟින් ප්‍රතික්ෂේප වී ඇතැයි යන නිගමනය කරා පැමිනියේය. පක්ෂය දැන් එහි විප්ලවවාදී ඉදිරිදර්ශනය අතහැර දැමීම අවශ්‍යයයි ඔහු තර්ක කලේය.

එහෙත් විසිවන සියවසේ හිමිදිරිය එලඹෙද්දී ධනේශ්වරයේ නියෝජිතයන් සංකල්පනය කල පරිදි ධනේශ්වර පාලනය සඳහා නොසැලෙන පදනමක් සම්පාදනය කරනවාට වඩා, ලෝක ධනේශ්වර ව්‍යුහය තුල ඇතිවූ ඉමහත් වෙනස්කම්, විප්ලවකාරී කැලඹීම් සඳහා පදනම දැමීය. තරුන රුසියානු මාක්ස්වාදියෙකු වූ ලියොන් ට්‍රොට්ස්කි පලමුවෙන්ම ඒවායේ වැදගත්කම පෙන්වා දුන්නවුන් අතර එක් අයෙක් විය. 1905 දී විස්තාරනය කල ඔහුගේ නොනවතින විප්ලවයේ න්‍යාය සඳහා පදනම දැමුවේ මෙම පරිවර්තනය පිලිබඳ ඔහු වර්ධනය කල විශ්ලේෂනයි.

"ධනවාදය සිය නිෂ්පාදන හා වානිජ්‍ය මාදිලීන් සමග සියලු රටවල් එකට බැඳ දමමින්, සමස්ත ලෝකය ම දේශපාලනිකව හා ආර්ථික වශයෙන් තනි ජීවියෙක් බවට පත්කර තිබේ. ඒ කෙසේ ද යත්, නූතන නය ක්‍රමය දහස් ගනන් ව්‍යාපෘතීන් අදෘෂ්‍යමාන හුයපටවලින් එකට බැඳ දමා බොහෝ සුලු සුලු බංකොලොත්වීම් වලක්වා ලමින් ප්‍රාග්ධනයට නොඇදහිය හැකි තරම් චපසරියකට ඉඩ සලසනු ලැබුව ද, ඒ සමග ම එය පෙර නොවූ විරූ පොදු ආර්ථික අර්බුදයක් කරා ඇදීයාමේ හේතු කාරකය බවට ද පත්වන ආකාරයට ම, ලෝක පරිමාන බද්ධ ව්‍යාපාරවස්තු සමාගයක් වැනි දෙයක් තුලට සියලු ප්‍රතිගාමී බලවේගයන් ආකර්ශනය කර ගන්නා ධනවාදයේ සමස්ත ආර්ථික හා දේශපාලන ව්‍යායාමය ම එනම් ලෝක වෙලඳම, එහි යෝධ රාජ්‍ය නය පද්ධතිය හා ජාතීන්ගේ දේශපාලන කාන්ඩ ගැසීම්, සියලු තනි තනි දේශපාලන අර්බුදයන්ට ප්‍රතිරෝධය දක්වා ඇතුවා පමනක් නොව පරිමානයෙන් පෙර නොඇසූ විරූ සමාජ අර්බුදයකට පදනම ද සූදානම් කිරීමෙනි." (Leon Trotsky *The Permanent Revolution and Results and Prospects*, ලියොන් ට්‍රොට්ස්කි, නොනවතින විප්ලව න්‍යාය සහ ඉදිරිදර්ශන සහ ප්‍රතිපල, නිව් පාර්ක්, 239-240 පිටු).

"පරිමානයෙන් පෙර නොඇසූ විරූ" අර්බුදය 1914 අගෝස්තු මාසයේදී ප්‍රථම ලෝක සංග්‍රාමය පුපුරායාමත් සමඟ මතුපිටට පැමිනියේය. අති මූලික මට්ටමේදී යුද්ධය, ලෝක ධනවාදයේ ජාතික රාජ්‍ය ව්‍යුහයට එරෙහිව නිෂ්පාදන බලවේගයන්හි කැරැල්ලක් වූ බව ට්‍රොට්ස්කි සිය *යුද්ධය හා ජාත්‍යන්තරය* නමැති කෘතිය තුල පැහැදිලි කලේය.

ලෝක ආර්ථිකයේ වර්ධනය නව දේශපාලන ව්‍යුහයක අවශ්‍යතාවය මතු කලේය. වර්ගයා සතු සියලු නිෂ්පාදකයන්ගේ බුද්ධිමත්, සංවිධානාත්මක සහයෝගයෙන් නොව, මෙම යුද්ධයෙන් ප්‍රමුඛ බලවතෙකුගේ සිට ලෝක බලවතෙක් බවට ඔසවා තැබූ එනම්, ජයග්‍රාහී රාජ්‍යයේ ධනපති පන්තිය විසින් ලෝකයේ ආර්ථික පද්ධතිය සූරාකෑම මගින් ය.

යුද්ධය ප්‍රකාශිත කලේ ජාතික රාජ්‍යයේ පමනක් නොව ධනේශ්වර ආර්ථිකයේ ද බිඳ වැටීමයි. එය වනාහි, එහිම ප්‍රතිවිරෝධයන් මගින් ආර්ථික පද්ධතියක් විනාශයට පත් කල ඉතිහාසයේ මහත්ම බිඳ වැටීමයි.

"මෙම ඓතිහාසික වාතාවරනය තුල, ආර්ථික වර්ධනයට ප්‍රධානතම බාධකය බවට පත්ව තිබෙන, පුරාවස්තු බවට හා අභාවයට පත් ජාතික "පීතෘභූමිය" ආරක්ෂා කිරීමෙහි ලා කම්කරු පන්තියට, නිර්ධනීන්ට කුමන ආශක්තයක් හෝ තිබිය නොහැකිය. කම්කරු පන්තියට ධනවාදයේ අධිරාජ්‍යවාදී ව්‍යාකූලත්වයට මුහුන දිය හැකි එකම ක්‍රමය වන්නේ, ලෝක ආර්ථිකය සමාජවාදී ලෙස සංවිධානය කිරීම දවසේ ප්‍රායෝගික ක්‍රියාමාර්ගය ලෙස ගනිමින්, ඊට එරෙහි වීම මගින් පමනි. සිය වර්ධනයේ උපරිම තැනට ලගාවී ඇති ධනවාදය, සිය නොවිසඳිය හැකි පරස්පර විරෝධයන් විසඳීමට උත්සාහ ගන්නා ක්‍රමවේදය වනාහි යුද්ධයයි. මෙම ක්‍රමවේදයට කම්කරු පන්තිය තමන්ගේ ම ක්‍රමවේදයෙන් එනම්, සමාජවාදී විධික්‍රමයෙන්, විරුද්ධ විය යුතුය"යි ට්‍රොට්ස්කි සමාප්ත කලේය.

1920 ගනන් මුලදී ට්‍රොට්ස්කි, ඉදිරිදර්ශනයන් පිලිබඳ සිය වැඩ කටයුතුවල දී, පලමුවන ලෝක සංග්‍රාමය හා ධනේශ්වර වර්ධනයේ චක්‍රය අතර සම්බන්ධය කරා පෙරලා පැමිනියේ ය. යුද්ධය පුපුරා යාම, 1890 ගනන් මැද ආරම්භ වූ චක්‍රයේ උඩු නැඹුරුවෙහි අවසානය සලකුනු කලේය. කෙසේ වුව ද යුද්ධය, ඉහල නැඟීම අවසානයකට පත් කලා නොව, ඉහල නැඟීම අවසන්වීමේ ප්‍රතිපලය වශයෙන් යුද්ධය හට ගත්තේය.

"තාක්ෂනික අර්ථයකින් ගත් කල, 1894 සිට 1913 දක්වා යුරෝපය පෙර නොවූ විරූ වේගයකින් හා බලයකින් යුක්තව වර්ධනය විය. වෙනත් වචන වලින් කිවහොත්, අධිරාජ්‍යවාදී යුද්ධයට පෙර 20 වසර තුල යුරෝපය, ආර්ථික වශයෙන් ධනවත් විය. යුද්ධය හට ගැනීමට වසරකට පෙරාතුව, 1913 වසර එලඹීමත් සමඟ, ධනවාදය එහි නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයෙහි ඇනහිටීමකට මුහුනපෑවේ, ධනේශ්වර දේපල හා සූරාකෑමේ ධනේශ්වර රූපාකාරය මගින් ඒවා මත පටවා තිබුනු සීමාවන් සමඟ ගැටුනු බැවිනි. වෙලඳපොල බෙදී ගිය අතර, තරඟය එහි උච්ඡතම අවස්ථාවට ලඟා විය. මේ තත්වය හමුවේ ධනේශ්වර රටවලට වෙලඳපොලින් එකිනෙකා පිටු දැකිමට හැකි වූයේ යාන්ත්‍රික ක්‍රමෝපායන් මගින් පමනකි.

"යුරෝපය තුල නිෂ්පාදන බලවේගයන්හි වර්ධනයට අවසන් තිත වැටුනේ යුද්ධයෙන් නොවේ. යුද්ධයම පැන නැඟුනේ, ධනේශ්වර වර්ධනයේ කොන්දේසි යටතේ තව දුරටත් යුරෝපය තුල නිෂ්පාදන බලවේගයන්හි වර්ධනයක් සිදුවිය නොහැකි වූ බැවිනි." (Trotsky, *The first fivr years of the Comintern*, ට්‍රොට්ස්කි, කොමින්ටර්නයේ පලමු වසර පහ, වෙලුම 2, නිව් පාර්ක්, 306 පිට.)

1920 ගනන් වල යුරෝපයේ ආර්ථික පරාවක්‍රය, ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය සනාථ කලේය. යුද්ධය නිමාවීමෙන් පසුව, පූර්ව යුද ආර්ථික කොන්දේසි කරා ආපසු යාගත නොහැකි විය. 1913 දී අත් කර ගෙන සිටි නිෂ්පාදන මට්ටම් කරා යලි නැඟ ගැනීමට යුරෝපීය ආර්ථිකය සමස්තයක් ලෙසම අරගලයක යෙදී සිටිය ද, එම අරමුන සාක්ෂාත් කරගනු ලැබුනේ 1925-26 කාලයේදී සමනි. තෙවසරක ආර්ථික වර්ධනයකින් පසුව 1928-29 වන විට යුරෝපයේ විශාලතම, ජර්මන් ආර්ථිකය පසුබෑමක් තුලට ඇතුල් වෙමින් තිබුනි.

එක්සත් ජනපදයේ තත්වය බෙහෙවින් වෙනස් විය. 1920-21 කාලයේ දැඩි පසුබෑමකින් පසුව එක්සත් ජනපද ආර්ථිකය, ඉන් පෙර නොදුටු ආකාරයේ පුපුරන සුලු වර්ධනයක් අත්විඳීය. 1919 සිට 1929 අතර කාලය තුල කාර්මික නිෂ්පාදන ශ්‍රම බලකායේ වැඩි වීමක් සිදු නොවූ තරම්ය. එහෙත් නිමැවුම සියයට 60 න් පමන ඉහල ගියේය. 1920 ගනන් අවසානයේ එක්සත් ජනපද ජනගහනය ගෝලීය සමස්තයෙන් සියයට 6 ක් පමනි. එහෙත් කාර්මික නිෂ්පාදනය ලෝක සමස්තයෙන් සියයට 40 ක් තරම් විය. ලෝකයේ මුලු යන්ත්‍රෝපකරන නිමැවුමෙන් එක්සත් ජනපදයේ පංගුව සියයට 57 ක් විය. 1920 ගනන් දශකයේ නිෂ්පාදන කර්මාන්තයේ විදුලි බල පාරිභෝජනය දෙගුන විය. ගෘහස්ත පාරිභෝජනය තෙගුන විය. ඊට පටහැනි ලෙස, 1920 යුරෝපීය කාර්මික නිෂ්පාදනය පැවතියේ 1913 මට්ටමෙන් සියයට 23 ක් හා 1923 දී සියයට 18 ක් පහලිනි.

මෙම තත්වය සැලකිල්ලට ගත් කල බැලූ බැල්මට පෙනීයා හැක්කේ, 1917 ඔක්තෝබරයේ බොල්ශෙවිකයන් බලය සඳහා දියත් කල අරගලයේ ඉදිරිදර්ශනය, එනම් ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය, අයථාර්තවත් වී ඇති බවයි. යුරෝපය එක තැන පල්වන අතර ඇමරිකානු ධනවාදය යටතේ නිෂ්පාදන බලවේග වර්ධනය විය.

එහෙත් එම තක්සේරුවේ ගැටලුව වූයේ එය, ලෝක ආර්ථිකය "යෝධ හා ස්වාධීන යථාර්තයක්" ලෙස නොසලකනු ලැබූතාක් දුරට හා, ට්‍රොට්ස්කිගේ වැකියක් යොදාගන්නේ නම්, එය විවිධ ජාතික කොටස්වල එකතුවක් ලෙස සලකනු ලැබූ තාක් දුරට, ලෝක ආර්ථිකය නොතකා හැර තිබීමයි. (පසුගිය වසරේදී

එක්සත් ජනපදයේ හටගත් ගෝලීය මූල්‍ය අර්බුදයේ බලපෑමෙන්, ඊනියා "ගැලවීයාමේ" (decoupling) සංසිද්ධිය නිසා අවශේෂ ලෝකයට කෙසේ හෝ පන බේරාගත හැකි වේයයි පලවූ විවිධ මතවාදයන් හේතුකොට ගෙන මෙම වැරැද්ද යලි යලිත් සිදුව තිබේ.)

එකම නිවැරදි, ගෝලීය ඉදිරිදර්ශනයක දෘෂ්ටි කෝනයකින් බැලූ විට චිත්‍රය මුලුමනින්ම වෙනස්වූ එකකි. නිසැකව ම 1920 ගනන්වල ඇමරිකානු ධනවාදය, යුරෝපීය ධනවාදයට වඩා බෙහෙවින් ශක්තිමත් හා වඩා ස්ථාවර බවක් පෙන්නුම් කලේය. එපමනක් නොව එය වර්ධනය වූයේ ද යුරෝපයේ වියදමිනි. එහෙත් ඇමරිකානු ධනවාදය තව දුරටත් ස්වයං දැරීමේ ශක්තියකින් යුක්ත නෙවේ. එය ලෝක ආධිපත්‍ය කරා නැඟී ආවේ, යුරෝපීය ජාතික රාජ්‍ය පද්ධතිය අරක්ගෙන තිබුනු වර්ගයේ සීමාවන් මඟින් අවහිර නොකල, දේශීය වෙලඳපොල සූරාකෑමෙනි.

කෙසේ වුව ද එම කාල පරිච්ඡේදය දැන් අවසානයකට පත්ව තිබුනි. ඇමරිකානු ධනවාදය රැඳී පැවතියේ ලෝක වෙලඳපොල මතය. එක්සත් ජනපදය පිහිටුවීමේ තැන් පටන් පැවති ධර්මතාවය, එනම් එය යුරෝපීය යුද්ධ වලට නොපැටලිය යුතුය යන්න ඉවත දමා අවසානයේදී, පලමු ලෝක යුද්ධයට අවතීර්න වීමට යටින් පැවති හේතුව එයයි.

ඇමරිකානු බැංකු හා මූල්‍යාධිකාරීන්, 1924 ඩේව්ස් සැලැස්ම තුල ඒ සා දැඩි ලෙස මැදිහත්වූයේ ද එබැවින්ය. එමඟින් උත්සාහ කලේ ජර්මන් ධනවාදය යලි පනගන්වමින් ඇමරිකානු ආයෝජන සඳහා වෙලඳපොලක් සපයා ගැනීමටය. සැබවින්ම යුරෝපය ඇමරිකාව මත රැඳී සිටි අතර ඊටත් වඩා ඇමරිකාව යුරෝපය මත රැඳී සිටියේ ය.

## මතු සම්බන්ධයි

© www.wsws.org